## මදුරාවල ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ කර්මාන්ත ණයහිමියන් වෙනුවෙන් වැඩියෙන් වෙන් කර තිබුණු රු.15,525 ක් සමාලෝචිත වර්ෂයේදී ගැලපීමේදී කර්මාන්ත ණයහිමි ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුමට බැර කළ යුතු වුවත් ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා ගිණුම බැර කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2015 වර්ෂයේ කර්මාන්ත ණයගැතියන් රු.831,884 කින් අඩුවෙන් දැක්වීම නිවැරදි කිරීමට කර්මාන්ත ණයගැති ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කළ යුතු වුවත්, කර්මාන්ත ණයගැති ගිණුම හර කර මූලධන ආධාර ගිණුම බැර කිරීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.831,884 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාල රු.80,440 ක් වූ විගණන ගාස්තු සමුච්චිත අරමුදලට හර කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් ගිණුම් ගත කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු මූල්‍ය ප්‍රකාශනවලින් අත් හැරී තිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මුද්දර ගාස්තු රු.11,028,975 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.4,875,932 ක් වශයෙන් දැක්වීම හේතුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.6,153,043 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2013 වර්ෂයේ මුද්දර ගාස්තු රු.223,645 කින් අඩුවෙන් බිල්කිරීම ගැලපීම සඳහා හිඟ හිටි මුද්දර ගාස්තු ගිණුම හර කර සමුච්චිත අරමුදල බැර කළ යුතු වුවත් ආදායම් ආධාර ගිණුම බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.223,645 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 2.2.1 ඡේදයේ (උ) නිවැරදි කර නොතිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු78,697,614 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.2,632,480 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදයමට වඩා වැඩි වූ වියදම රු.84,825 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,717,305 ක වර්ධනයක් දක්නට ලැබුණි.

මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,717,305 ක වර්ධනය කෙරෙහි ආදායම් රු.6,056,440 කින් වැඩිවීම හා වියදම් රු.3,339,135 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 991 | 842 | 555 |
| (ii) බලපත්‍ර ගාස්තු | 262 | 262 | -- |

2.2.2 **වරිපනම් බදු**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.705,511 ක වරිපනම් බදු හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.303,215 ක් හෙවත් සියයට 43 ක් අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කළ ආදායම රු.573,407 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ ඉන් රු.432,485 ක් හෙවත් සියයට 75 ක් අයකරගෙන තිබුණි.

(ඇ) තක්සේරු කර ඇති දේපලක භෞතික වෙනසක් සිදු වූ විට ප්‍රාදේශීය සභා පනතේ 143(1) අනුව තක්සේරුව ප්‍රතිශෝධනය කර නොතිබුණි.

(ඈ) සභා බල ප්‍රදේශයේ 2011 වර්ෂයේ වරිපනම් ඒකක 2258 ක් පැවති අතර එය 2016 වර්ෂය අවසානය වන විට ඒකක 2239 දක්වා අඩුවී තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතු හිඟ වරිපනම් ශේෂය රු.543,217 ක් වූ අතර ඉන් වර්ෂ 3 ඉක්ම වූ හිඟ ශේෂය රු.59,914 ක් හා වර්ෂ 5 ඉක්ම වූ හිඟ ශේෂය රු.119,716 ක් විය. ප්‍රාදේශීය සභා පනතේ 161 වගන්තිය අනුව හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3** <u>**කර්මාන්ත බදු/ ව්‍යාපාර බදු/ වෙළඳ බලපත්‍ර**</u>

කර්මාන්ත බදු/ ව්‍යාපාර බදු/ වෙළඳ බලපත්‍ර ආදායම් අයකිරීම සඳහා සමීක්ෂණ සිදු කර ඒ අනුව බිල් කිරීම් කර බදු මුදල් අය කළ යුතු වුවත් බදු මුදල් ලෙස ලැබෙන ආදායම වර්ෂයේ බිල්කිරීම් ලෙස සටහන් කර තිබුණි.

2.2.4 <u>**උසාවි දඩ හා මුද්දර ගාස්තු**</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 4,397,583 |
| (ii) | මුද්දර ගාස්තු | 4,875,932 |

3. <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

3.1 <u>**මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා**</u>

(අ) 2006 අප්‍රේල් 15 දින සිට ප්‍රාදේශීය සභාව ස්ථාපිත කරන විට බුලත්සිංහල ප්‍රාදේශීය සභාව සතුව තිබුණු වත්කම් හා වගකීම් බුලත්සිංහල සහ මදුරාවල ප්‍රාදේශීය සභා වෙනුවෙන් වෙන්කොට තිබුණද 2017 ජුනි 11 දින වන විටත් එම වත්කම් හා වගකීම් නීත්‍යානුකූලව බෙදාහදාගැනීමට කටයුතු කර නොතිබුණි. මදුරාවල ප්‍රාදේශීය සභාවට ආරම්භයේදී දැනට පවත්නා සභා ඉඩම හා ගොඩනැගිල්ල ඇතුළු සුසානභූමි, වෙනත් ඉඩම් හා ගොඩනැගිලි ලබාදී තිබුණද ආරම්භක ශේෂ පත්‍රයේ ඉඩම් හා ගොඩනැගිලි කිසිවක් දක්වා නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණය කර ගිණුම් ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ආ) <u>**නිල ඇඳුම් දීමනාව**</u>

2013 අප්‍රේල් 22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2013 පරිදි වසරකට එක් අයෙකුට රු.4,000 බැගින් කාර්ය මණ්ඩලයේ 86 දෙනෙකු වෙනුවෙන් රු.344,000 ක මුදලක් ගෙවා තිබුණි.

ඉහත චක්‍රලේඛයේ (ආ) ඡේදයට අනුව නිල ඇඳුම් දීමනාව ලබන නිලධාරීන් රාජකාරි වේලාව තුළ නිල ඇඳුම් නොපැළඳීම සම්බන්ධයෙන් 1991 අගෝස්තු 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 27/91 හි විධිවිධාන අනුව ක්‍රියාකිරීමට ආයතන ප්‍රධානීන් කටයුතු කර නොතිබුණි.

3.2 <u>මතභේදයට තුඩු දෙන ගනුදෙනු</u>

<u>පුස්තකාලය සඳහා ගෘහභාණ්ඩ ලබාදීම</u>

මදුරාවල පුස්තකාලය සඳහා පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.1,339,732 ක් වටිනා ලීබඩු උපකරණ ලබා දී තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පුස්තකාලයට අවශ්‍ය පිරිවිතරයන්ට භාණ්ඩ ලබාදී නොතිබුණු අතර කුඩා ළමුන් සඳහා ආරක්ෂාකාරී බවින් තොරවූ ප්ලාස්ටික් පුටු ලබාදී තිබුණි.

(ආ) පුස්තකාලයේ විමර්ෂණ කටයුතු සඳහා අවශ්‍යව තිබූ මේස වෙනුවට එක් වරකදී එක් අයෙකුට පමණක් භාවිතා කළ හැකි එකක් රු.9,950 ක් සහ වටිනාකම රු.69,650 ක් වූ මේස 07 ක් ලබාදී තිබුණි.

(ඇ) එකක් රු.15,900 බැගින් රු.445,200 ක් වටිනා පොත් රාක්ක 28 ක් ලබාදී තිබුණු අතර එම පොත් රාක්ක ප්‍රමාණයෙන් පළලින් වැඩි ඒවා වූ බැවින් එම පොත් රාක්ක සියල්ලෙහිම මැද තට්ටු පොත්වල බරට පහත් වී තිබුණි. තවද, ඉන් එක් තට්ටුවක් ගැලවී ගොස් තිබූ බැවින් සපයන ලද පොත් රාක්ක 28 ම ගැලවී වැටීමේ අවදානමක් පවතින නිසා අනාරක්ෂිත විය.

3.3 <u>නිශ්ක්‍රීය /ඌන උපයෝජිත වත්කම්</u>

(අ) <u>දික්ලන්ද ජල ව්‍යාපෘතිය</u>

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ නිවාස 21 කට ජලය ලබාදීම වෙනුවෙන් රු.6,604,411 ක මුදලක් වැය කර ව්‍යාපෘතිය 2016 ඔක්තෝබර් 10 දින සභාවට භාර දී තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2017 ජූනි 19 දින වන විටත් ජල සැපයුම ලබා දී නොතිබුණි.

(ii) ඉදි කර තිබුණු ලිදෙහි ජලය කළුතර ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය මගින් පරීක්ෂා කර තිබූ අතර ජලයේ අහිතකර බැක්ටීරියා තත්ත්වයක් නිසා පරිභෝජනයට නුසුදුසු බවට වාර්තා කර තිබුණි.

(iii) පුරනැගුම ව්‍යාපෘතිය අවසන් වීම හා පිරිසිදු ජලය සැපයීමේ වගකීම ප්‍රාදේශීය සභාවට පැවරීම නිසා අමතර වියදම් ප්‍රාදේශීය සභාවට දැරීමට සිදුව තිබුණි.

(ආ) <u>රෙමුණ ජල ව්‍යාපෘතිය</u>

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.17,800,877 ක් වැය කර පවුල් 74 කට ජලය සැපයීමේ අරමුණෙන් ව්‍යාපෘතිය නිම කර 2016 ඔක්තෝබර් 10 දින සභාවට පවරා තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ජල ව්‍යාපෘතිය සඳහා වොට් 400 ක විදුලි ධාරිතාවයක් අවශ්‍යව තිබුණද වොට් 375 ක විදුලි ධාරිතාවයක් ලබාදීම නිසා දිනකට පැය 2 ක කාලයක් පවුල් 51 කට පමණක් ජලය ලබාදී තිබූ අතර විධිමත් ජල සැපයුමක් ලබාදීමට නොහැකි වී තිබුණි.

(ii) පෞද්ගලික ඉඩම් හිමිකරුවන් විසින් අභියාචනාධිකරණයේ නඩුවක් ගොනු කර තිබීම නිසා ට්‍රාන්ස්ෆෝමරයක් සවි කර විදුලි ධාරිතාවය වැඩි කර ගැනීමටද නොහැකි වී තිබුණි.

(iii) පොළව අභ්‍යන්තරයේ එළා ඇති ජලනල පද්ධතිය නිතර නිතර පළුදුවීම, ජලය කාන්දුවීම, ජල ටැංකිය සඳහා ස්වයංක්‍රීයව ජලය පිරෙන වැල් අක්‍රියවීම හා මිනිස් ක්‍රියාකාරකම්වලින් තොරව ජලමනු අක්‍රියවීම සිදුව තිබීම නිසා ඒවා යථා තත්වයට පත්කිරිම සඳහා සභා අරමුදල් වැය කිරීමට සිදුව තිබුණි.

(ඇ) <u>අඟුරුවාතොට බහුකාර්ය මධ්‍යස්ථානය</u>

ආසන 160 ක ශාලාවකින් සහ වෛද්‍ය සායන සඳහා ඉදි කරන ලද ගොඩනැගිලි දෙකකින් යුක්තව පුරනැගුම ව්‍යාපෘතිය යටතේ රු.22,230,385 ක ඇස්තමේන්තුගත වියදමකින් ඉදි කරන ලද බහුකාර්ය මධ්‍යස්ථානය 2016 නොවැම්බර් 18 දින සභාවට භාරදී තිබුණි. නිරීක්ෂණ පහත දැක්වේ.

(i) 2017 ජූනි 19 දින වන විට සතියකට දින දෙකක් පමණක් වෛද්‍ය සායන පවත්වා තිබුණු අතර ආසන 160 කින් යුක්ත වූ ශාලාව වැඩසටහන් දෙකකට පමණක් යොදාගෙන තිබුණි.

(ii) මෙම මධ්‍යස්ථානය සඳහා ලබාදී තිබුණු පුටු 24 ක් ඇණවුම් කරන ලද පිරිවිතරයන්ට අනුකූල නොවන ලෙස සපයා තිබුණි.

(iii) ඒ අනුව, රු.22,320,385 ක් වූ ගොඩනැගිල්ල හා රු.1,643,396 ක් වූ ලීබඩු ඇතුළත්ව එකතුව රු.23,963,781 ක් වැය කර ඉදි කර තිබූ බහුකාර්ය මධ්‍යස්ථානය ඌන උපයෝජිතව තිබුණි.

3.4 <u>හඳුනාගත් අලාභ</u>

පළාත් පාලන කොමසාරිස් වෙත රු.1,412,545 ක මුදලක් ගෙවීම් කර ලබාගෙන තිබුණු ඩබල් කැබ් රථය 2016 දෙසැම්බර් 31 දින අනතුරකට ලක්ව තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) වාහනයේ අයිතිය සභාවට පවරාගෙන නොතිබුණි.

(ii) වාහනයේ බාහිර කොටස්වලට හානි සිදු නොවී එන්ජිමට පමණක් හානි සිදුව තිබූ අතර අනතුර සම්බන්ධව පරීක්ෂණ මණ්ඩල 3 ක් පරීක්ෂණ පවත්වා තිබුණද, 2017 ජූනි 19 දින වන විටද අලාභ හානි වාර්තා සකස් කර නොතිබුණි.

(iii) ප්‍රාදේශීය සභාවේ මුරකරුවෙකු වාහනයේ රියදුරු ලෙස කටයුතු කරමින් සිටියදී අනතුර සිදුව තිබුණු අතර වාහනයේ එන්ජිමේ අභ්‍යන්තර කොටස් සියල්ලම කැඩී ගොස් ඇති බැවින් ඒ සඳහා අළුත් එන්ජිමක් සවිකිරීමට නියෝජිත ආයතනය විසින් රු.3,089,810 ක (වැට් රහිත) ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි.

3.5 <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව යම් ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපනික කාර්යයක් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000 කට වඩා වැඩි වියදම් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අවසරය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතිය ලබාගැනීමකින් තොරව රු.122,632 ක් වැය කර තිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් පාලනය

(ඇ) ආදායම් පාලනය

(ඈ) අයවැය පාලනය